**ශීර්ෂය 209 ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

---

### 1.1 තත්ත්වාගණනය කළ මතය

---

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන් දීමේ නිලධාරි වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 මැයි 12 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයේ ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|
| 1.6.1.1 (අ) | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවට අයත් පොත්පත්, ලේඛන, පෞරාණික ගිවිසුම් හා රහස්‍ය ලේඛන ආදී මිලකල නොහැකි ප්‍රවේණිගත වත්කම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමක් කර නොමැති බවත්, එම ප්‍රවේණිගත වත්කම් වසර ගණනාවකින් විධිමත් සමීක්ෂණයකට ලක් කර නොමැති බවත් නිරීක්ෂණය විය. | මෙම වත්කම් සමීක්ෂණයක් කිරීමට සහ ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමක් කළ යුතුවීම. |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

---

#### (අ) ආදායම් නොවන ලැබීම්

---

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේදී ස්ථාන මාරුවී ගිය සේවක ණය ශේෂ ශීර්ෂ අතර මාරු කිරීමේදී ණය ශේෂ නිවැරදිව හඳුනාගෙන මාරු නොකිරීම නිසා, එකතුව රු.120,202 ක නිරවුල් නොකළ හිඟ ණය ශේෂයක් තවදුරටත් පැවතුණි. | ස්ථාන මාරුවී ගිය සේවක ණය ශේෂ හඳුනා ගැනීමේදී වරදක් සිදු වී ඇත. මාරු සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | මෙම හිඟ ණය ශේෂ අයකරගෙන නිරවුල් කළ යුතු වීම. |

**(ආ) පුනරාවර්තන වියදම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශනයේ සහනාධාර පොළී සහ මාරු කිරීම් වල ඇස්තමේන්තුගත ශුද්ධ ප්‍රතිපාදනය සහ තත්‍ය වියදම් එකතුව පිළිවෙලින් රු.1,038,000 ක් සහ රු.888,838 ක් වුවත්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය අනුව එය පිළිවෙලින් රු.300,000 ක් සහ රු.387,691 ක් ලෙස සටහන් කිරීම නිසා සහනාධාර පොළී සහ මාරු කිරීම් පිළිවෙලින් රු.738,000 කින් සහ රු.501,147 කින් අඩුවෙන් සටහන් කර තිබුණි. | මුද්‍රණ දෝෂයකින් සටහන් අංක 05 යටතේ ඇතුළත්ව ඇති අතර, එම හේතුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි සමස්ථ පුනරාවර්ථන වියදම් කෙරෙහි කිසිඳු ආකාරයකින් ඌන බලපෑමක් සිදුවී නොමැත. | නිවැරදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුමේ සැසඳුම් ප්‍රකාශය අනුව 2020 දෙසැම්බර් 31 දිනට හිඟ ණය ශේෂ එකතුව රු.17,672,837 ක් වූ අතර, එදිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය අනුව එම ශේෂ එකතුව රු.18,114,012 ක් වූයෙන් රු.441,175 ක වෙනසක් විය. | අතපසුවීමකින් ගැළපීම් කර මූල්‍ය වාර්තාවේ දක්වා නොමැත. | අදාළ ගැළපීම් සිදු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වීම. |

**(ඈ) තැන්පතු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (i) 2018 වර්ෂය තුළ පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කළ එකතු වටිනාකම රු.569,562 ක් වූ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 570 සහ 571 අනුව කටයුතු කර නොතිබුණි. | ගෙවීම් 02 ක් නිරවුල් කර ඇති අතර, ඉතිරි තැන්පතු නිරවුල් කිරිම මුදල් රෙගුලාසි 571 අනුව කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව තැන්පතු නිරවුල් කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ii) 2016 අප්‍රේල් 11 දිනැති අංක 249/2016 දරන රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩාගාර පොදු තැන්පත් ගිණුමේ ශේෂ සැසඳුම් ප්‍රකාශය සමඟ කාල විශ්ලේෂණ වාර්තාවක් සකස් කර භාණ්ඩාගාරයට යැවිය යුතු වුවත්, 2020 දෙසැම්බර් 31 දිනට එම වාර්තාව යැවීමට කටයුතු කර නොතිබුණි. | අදාළ වාර්තා යවා ඇත. | වාර්තාව යැවූ බව සඳහන් කළද, විගණන අංශය වෙත ඉදිරිපත් කළ යුතු වීම. |

**(ඉ) දේපල පිරියත හා උපකරණ**

**-------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ..

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය පිහිටි නව සහ පැරණි ගොඩනැගිලි, මහනුවර පිහිටි ගොඩනැගිල්ල, පැරණි ආපනශාලා ගොඩනැගිල්ල සහ එහි ස්ථාපනය කර ඇති මධ්‍යම වායුසමීකරණ පද්ධතිය ඇතුළු සියළු මූල්‍ය නොවන වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දේපළ පිරියත හා උපකරණ යටතේ තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉඩමේ අයිතිය ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීම් කර ඇත. දේපළ පවරාගෙන තක්සේරු කර ගිණුම්ගත කිරීමට අපේක්ෂා කරමි. | දේපළ පවරාගෙන තක්සේරු කර ගිණුම්ගත කළ යුතුවීම. |
| (ii) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් වල ශේෂ සටහන් කිරීමේදී එකතුව රු.5,164,870 ක් වූ ඉදිකිරීම් උපකරණ කාර්මික හා නිෂ්පාදන උපකරණ ලෙසත්, එකතුව රු.446,229 ක් වූ විකාශන උපකරණ ඉදිකිරීම් උපකරණ ලෙසත්, විකාශන උපකරණ සඳහා වටිනාකමක් නොමැති ලෙසත්, දෝෂ සහිතව ගිණුම් ගත කර තිබුණි. | මෙය මුද්‍රණ දෝෂයක් වන අතර, සමස්ථ වත්කම් සඳහා කිසිඳු බලපෑමක් සිදු වී නොමැත. | නිවැරදි මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (iii) දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල පිහිටුවා ඇති තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, කුරුදුවත්ත ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මු.පි.කො. 9582 කැබලි අංක 01 දරන ඉඩම් කොටස පවරාගෙන මූල්‍ය ප්‍රකාශනවල තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ප්‍රධාන කාර්යාලය පිහිටා ඇති ඉඩම් කොටස පවරා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. | ඉඩම් පවරාගෙන ගිණුම්ගත කළ යුතුවීම. |

**(ඊ) ගණන් දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ, විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී අදාළ පරිදි අභ්‍යන්තර පාලන පද්ධතීන් සමාලෝචනය කර අදාළ වාර්තාවන් විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | 201 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |

(උ) **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (i) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන චක්‍රලේඛයෙහි මාර්ගෝපදේශ අංක 01 (ඉ) වගන්තිය | සේවය හැරගිය නිලධාරීන් 04 දෙනෙකුට අදාළව වර්ෂ 05 කට වඩා පැරණි රු. 264,875 ක හිඟ ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ඉතා පැරණි ශේෂ අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව පැරණි ණය ශේෂ නිරවුල් කළ යුතු වීම. |
| (ii) 2020 අගෝස්තු 28 දින - අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය සහ මාර්ගෝපදේශ අංක 14 | දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාවේ කෙටුම්පතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | කාර්යසාධන වාර්තාවේ කෙටුම්පත කඩිනමින් විගණනයට ඉදිරිපත් කරමි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුනරාවර්ථන සහ ප්‍රාග්ධන වැය විෂයයන් 11 ක් සඳහා වූ ශුද්ධ ප්‍රතිපාදනයන් පිළිවෙලින් රු.5,469,415 ක් සහ රු.47,457,241 ක් අදාළ කාර්යයන් සඳහා උපයෝජනය නොකර ඉතිරි කර තිබුණු අතර එම ඉතිරිකිරීම් වාර්ෂික ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 29 සිට සියයට 100 දක්වා පරාසයක් තුළ විහිදී පැවතුණි. | මාර්තු මාසයේ සිට කොවිඩ් වසංගත තත්ත්වය මත වියදම් ඇති නොවීම. | වර්ෂය සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන ඇස්තමේන්තු වලට ඇතුළත් කළ යුතු වීම. |

### 2.2 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

-----------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂ එකතුව රු.243,816 ක් 2020 අගෝස්තු 28 දින සහ අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ මාර්ගෝපදේශ අංක 01 ප්‍රකාරව නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සිහිකැඳවීම් කර අයකර ගැනීමට හෝ චක්‍රලේඛ අනුව කටයුතු කිරීමට අපේක්ෂිතය. | මෙම හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**2.3** **බැංකු ගිණුම් මෙහෙයවීම**

-----------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර තිබුණු ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ 2020 දෙසැම්බර් 31 දිනට මාස 06 ට වැඩි කල් ඉකුත් වූ එකතු වටිනාකම රු.182,601 ක් වූ චෙක්පත් 14 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඈ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1** **ප්‍රසම්පාදනයන්**

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනයන් සඳහා මුළු අයවැයගත වියදම් එකතුව රු.236,823,000 ක් වූ අතර, වර්ෂය තුළ ප්‍රසම්පාදන කාර්යයන් සඳහා දරන ලද | රටේ පැවති කොඩ්ඩ් වසංගත තත්ත්වය හේතුවෙන් අපේක්ෂිත ඉලක්කයට ලඟා වීමට නොහැකි වීම. | වර්ෂය තුළ ලඟා විය හැකි මට්ටම සලකා බලා සැලසුම් සකස් කිරීමට හා සැලසුම් අවශ්‍යතාවය අනුව සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| තත්‍ය වියදම රු.26,630,000 ක් විය. ඒ අනුව වර්ෂය තුළ සැලසුම් ප්‍රකාරව ඉටු නොකළ ප්‍රසම්පාදන කාර්යයන් වල මූල්‍ය වටිනාකම රු.210,193,000 ක් විය. | | |
| (ආ) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුව, ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 992 ක වටිනාකමකට අංක අමප./17/2988/742/050 දරන සහ 2018 ජනවාරි 17 දිනැති අමාත්‍ය මණ්ඩලය පත් කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටු නිර්දේශයන්ට අනුව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත ලබාදී තිබුණි. මෙම ගොඩනැගිල්ල පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරිම පිළිබඳව පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කිරීමට නියමිත දිනය 2020 ජූලි 07 දින වුවත්, 2021 මැයි 18 දින දක්වා ගිවිසුම් කාලය දීර්ඝ කර තිබුණි. 2021 අප්‍රේල් 01 දිනට ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ කටයුතුවල වර්තමාන භෞතික ප්‍රගතිය සියයට 46 ක් වූ අතර එහි, මූල්‍ය ප්‍රගතිය සියයට 30 ක් විය. | කොවිඩ් වසංගත තත්ත්වය නිසා ඇති වූ ප්‍රමාදය සහ ලේඛන විධිමත් පරිදි නව ස්ථාන වලට මාරු කිරීමේ ප්‍රමාදයන් වීම කාලය දීර්ඝ කිරීමට හේතු විය. | කාලය දීර්ඝ කළ පසුව එළඹෙන දිනට කාර්යය නිම කිරීමේ ගැටළු ඇති වී ඇති බැවින් කඩිනමින් කාර්යය නිම කළ යුතු වීම. |
| | මේ වන විට බිල්පත් ගෙවීමට පෙර පරීක්ෂා කරනු ලැබේ. | බිල්පත් ගෙවීමට පෙර සුදුසුකම් සහිත නිලධාරියෙකු පරීක්ෂා කළ යුතුවීම. |
| (ii) ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය හා සී/ස මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම යන ආයතන විසින් දෙපාර්තමේන්තුවට ලබා දෙන බිල්පත් සුදුසු තාක්ෂණික නිලධාරියකු හෝ | | |

ප්‍රමාණ සමීක්ෂණ නිලධාරියකුගේ පරීක්ෂාවට ලක් කිරීමෙන් තොරව ගෙවීම් කර තිබුණි.

**4.** **මානව සම්පත් කළමනාකරණය**

---------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 287 ක් වූ අතර, අනුමත තනතුරු වලට අදාළව සේවකයින් 153 දෙනෙකු එනම්, ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු වලින් සියයට 50 ක්ද, තෘතීය මට්ටමේ තනතුරු වලින් සියයට 70 ක සේවක ඌනතාවයක් පැවතුණි. මෙම සේවක ඌනතාවය සම්පූර්ණ කිරීමට කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි. | මෙම බඳවා ගැනීම් සඳහා ක්‍රියා කරමින් පවතී. | ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් බඳවා ගැනීමට ක්‍රියා කළ යුතු විම. |